## මාර්ග නඩත්තු භාර අරමුදල - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට මාර්ග නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

භාර ඔප්පුවේ 11 වගන්තිය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඊළඟ වර්ෂයේ අප්‍රේල් අවසන් වීමට පෙර හෝ එදිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2013 ජුනි 21 දිනදීය.

#### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මාර්ග ආංශික සහාය ව්‍යාපෘතියෙන් මාර්ග නඩත්තු භාර අරමුදල සඳහා රු. 1,186,594 ක් වටිනා කාර්යාල උපකරණ ලැබී ඇතත්, එහි අයිතිය මාරුකර නොතිබූ අතර වත්කම්වල වටිනාකමද ගිණුම්වලට ගෙන නොතිබුණි.

#### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** හඳුනාගත් මාර්ග නඩත්තු වැඩසටහන් සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ මූල්‍යනය යටතේ මාර්ග නඩත්තු භාර අරමුදලින් ලැබෙන අරමුදල් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වාණිජ බැංකුවක විශේෂිත රුපියල් ගිණුමක් විවෘත කල යුතුය. මාර්ග නඩත්තු භාර අරමුදලේ ප්‍රතිපත්ති අනුව මාර්ග සංවර්ධන අධිකාරිය එම අවශ්‍යතාවයන්ට අනුකූලවී නොතිබුණි.

**(ආ)** මහබැංකුවේ පවත්වාගෙන යන විශේෂ (ඩොලර්) ගිණුමට අදාලව සැසඳුම් වාර්තා පිළියෙල කර නොතිබුණි.

**(ඇ)** ගිණුම් අනුව මුළු වියදම රු. 3,909,883 ක් දක්වා තිබූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල ඊට අනුරූපී අගය රු.2,179,326 ක් වුයෙන් රු. 1,730,557 ක වෙනසක් පෙන්නුම් කෙරුණි.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | පිළිනොපැදීම |
|---|---|
| **(අ)** **(i)** 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඊ/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය | භාර අරමුදලේ වාර්ෂික අයවැය ලේඛනය ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් 15 දින හෝ ඊට පෙර පිළියෙල කර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ට හා රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ට ඉදිරිපත් කළ යුතුය. එසේවුවත් සමාලෝචිත වර්ෂය සඳහා වු වාර්ෂික අයවැය ලේඛනය අවශ්‍ය පරිදි පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ii)** 4.3 ඡේදය | වාර්ෂික කාර්ය සාධන වාර්තා හා සමුච්චිත අරමුදලේ වෙනස්වීම් ප්‍රකාශනය මුල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ඡේදය | නිශ්චිත ව්‍යාපෘති කාලපරිච්ජේදය තුල ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීමට මාසිකව, ත්‍රෛමාසිකව හා වාර්ෂිකව යනාදි වශයෙන් අපේක්ෂිත මුල්‍යමය හා භෞතික ඉලක්ක දක්වමින් සම්පූර්ණ ව්‍යාපෘති කාලපරිච්ජේදයම ආවරණය වන පරිදි විස්තරාත්මක සමස්ත සැලැස්මක් පිළියෙල කල යුතුය. කෙසේවෙතත් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. |
| **(ඇ)** 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය | විගණන කමිටු මාස 3 කට එක් වරක්වත් අවම වශයෙන් විධිමත් පරිදි රැස්විය යුතු වුවත් අවශ්‍ය පරිදි එසේ රැස්වී නොතිබුණි. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මාර්ග නඩත්තු භාර අරමුදලේ ලේකම් කාර්යාලය, ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්ට අනුකූලව පිළිගත් මාර්ග නඩත්තු ප්‍රමිත/ අත්පොත් භාවිතා කරමින් මාර්ග නඩත්තුවල ගුණාත්මකභාවය තහවුරු වන පරිදි නියැදි පදනම මත මාර්ග නඩත්තු කටයුතු පිළිබඳ තාක්ෂණික විගණනයන්හි අඛණ්ඩව යෙදිය යුතුය. තාක්ෂණික විගණකවරුන් යොදවා පාරිශ්‍රමිකයන් ලෙස රු. 496,152 ගෙවා තිබුණද, තාක්ෂණික විගණනයේ කාර්ය සාධන වාර්තා භාර මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ii)** භාර ඔප්පුවේ 19 වගන්තියට අනුව තිරසාර මාර්ග නඩත්තු මූල්‍යයනයක් සැපයීමේදී භාරයේ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීමට හා භාරයේ මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ මාර්ගයන් පරීක්ෂා කිරීම සඳහා භාරය ආරම්භ කිරීමෙන් වර්ෂ 3 කට පසු භාරයේ කටයුතු පිළිබඳ සමාලෝචනයක් සිදුකළ යුතුය. 2006 ජනවාරි 1 දින සිට බලපාන පරිදි භාරය මෙහෙයුම් කටයුතු සිදුකර තිබුණද, භාර අරමුදලේ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය භාර කළමනාකරණ මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණි.

**(iii)** 2005 ඔක්තෝබර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4 ජේදයට අනුව 2006 ජනවාරි 1 දින සිට බලපාන පරිදි රජයට පෙට්‍රල් හා ඩීසල් විකිණීමෙන් ලැබෙන ආදායමින් පෙට්‍රල් ලීටරයකට රුපියල් 1 ක් හා ඩීසල් ලීටරයකින් ශත 50 ක් බැගින් රජය භාර අරමුදලට බැරකල යුතුය. ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉන්ධන සෙස් බදු අරමුදල ස්ථාපිත කර ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

**(iv)** මාර්ග සංවර්ධන අධිකාරියේ ජාතික මාර්ග නඩත්තු කටයුතු සඳහා රු. මිලියන 1,332 ක මුදලක් නිදහස් කර තිබූ අතර ඉන් රු. මිලියන 111 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ දකුණු පළාත සඳහා නිදහස් කර තිබුණි. මෙම මුදල ජාතික මාර්ග නඩත්තු කටයුතු සඳහා යොදවා නොතිබුණු අතර දකුණු පළාතේ ප්‍රාදේශීය සභා වලට අයත් ග්‍රාමීය මාර්ග සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි.

**(v)** උපදේශක සේවාව විසින් නිකුත් කරන ලද මාර්ග නඩත්තු භාර අරමුදලේ ප්‍රතිපත්ති ප්‍රකාරව, මාර්ග සංවර්ධන අධිකාරිය ලේකම් කාර්යාලය හරහා පමණක් ක්‍රියාත්මක විය යුතුය. ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව මාර්ග නඩත්තු භාර අරමුදල හරහා මාර්ග සංවර්ධන අධිකාරියට රු. මිලියන 1,332 ක් සමාලෝචිත වර්ෂයේ මුල් කාර්තුව සඳහා නිදහස් කර තිබූ අතර ඉහත ප්‍රතිපත්ති අවශ්‍යතාවයන් උල්ලංඝනය කරමින් වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය සෘජුවම රු. මිලියන 4,629 ක් මාර්ග සංවර්ධන අධිකාරියට නිදහස් කර තිබුණි.

**(vi)** සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව අනුව මුළු ප්‍රතිපාදනය රු. මිලියන 5,500 ක් වුවත් රු. මිලියන 1,332 ක් පමණක් භාර අරමුදල හරහා සමාලෝචිත වර්ෂය සඳහා උපයෝජනය කර තිබුණි. අරමුදලේ භාර ඔප්පුවේ 4 වගන්තියට අනුව මාර්ග නඩත්තු භාර අරමුදල පිහිටුවීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටුවී නොතිබුණි. එබැවින් මාර්ග නඩත්තු භාර අරමුදලේ ප්‍රතිපත්ති වලට අනුව අරමුදල ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය.

**(v)** මාර්ග ආංශික සහාය ව්‍යාපෘතිය යටතේ මාර්ග නඩත්තු භාර අරමුදලේ ලේකම් කාර්යාලය පිහිටුවීම සඳහා රු. මිලියන 74,717,634 ක මුදලක් තාක්ෂණික සහාය උපදේශක සේවාවක් සඳහා වැය කර තිබුණද, එම නිර්දේශ හා ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.2 මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව භාර අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 340,985,888 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 3,481,215 ක් වුයෙන් රු. 337,504,673 ක මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේ ලැබීම්, ගෙවීම් හා ශුද්ධ අතිරික්තය පහත සාරාංශයෙන් දැක්වේ.

| | 2012 | |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| භාණ්ඩාගාරයෙන් ලැබීම් | 1,332 | |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබීම් | 339.8 | |
| මුළු ලැබීම් | | 1,671.8 |
| මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීම් | 1,332 | |
| මාර්ග නඩත්තු භාර අරමුදලේ නඩත්තු වියදම් | 4 | |
| මුළු ගෙවීම් | | (1,336) |
| | | 335.8 |
| එකතු කලා : භාණ්ඩාගාර බිල්පත් මත පොලිය | 5 | |
| විනිමය ලාභය | 0.2 | 5.2 |
| ශුද්ධ අතිරික්තය | | 341 |

## 2.3 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල වීමෙන් තොරව මාර්ග නඩත්තු භාර අරමුදල විසින් පුද්ගලික අංශයෙන් කුලී ගෙවීම් පදනම මත වාහන 3 ක් රු. 2,273,540 ක් වූ වාර්ෂික ගෙවීමකට ලබා ගෙන තිබුණි.

**(ii)** වාහන භාවිතය සඳහා නිශ්චිත නිළධාරියෙකුට වගකීම් පවරා නොතිබුණු අතර භාවිතා කල වාහන පිළිබඳ විස්තර නොමැතිවීමෙන් වාහන භාවිතයේ කාර්ය සාධනය සතුටුදායකද යන්න විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 3. සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

භාර අරමුදලේ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ඡේදයට අනුව ක්‍රියාකාරී සැලැස්ම හා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 4. පද්ධති පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර භාර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

**(අ)** වාහන උපයෝජනය

**(ආ)** භාර අරමුදලේ මෙහෙයුම්

**(ඇ)** අභ්‍යන්තර පාලනය